පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 13

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- යුරෝපා ඉතිහාසය II ( I කොටස) 25 S I

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : .............................

කාලය :

| | | | | |
|---|---|---|---|---|
| 1) 04 | 2)02 | 3)02 | 4)01 | 5)04 |
| 6)01 | 7)05 | 8)04 | 9)02 | 10)02 |
| 11) 05 | 12)02 | 13)01 | 14)05 | 15)05 |
| 16) 04 | 17)01 | 18)02 | 19)04 | 20)02 |
| 21) 02 | 22)05 | 23)02 | 24)05 | 25)03 |
| 26) 04 | 27)01 | 28)03 | 29)04 | 30)05 |
| 31) 04 | 32)04 | 33)03 | 34)01 | 35)03 |
| 36) 02 | 37)02 | 38)04 | 39)02 | 40)04 |

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 13 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- යුරෝපා ඉතිහාසය II (II කොටස) | 25 | S | II |

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : .............................

කාලය :

## A කොටස

01)



## B කොටස

02)

- ක්‍රි.පූ. 7 වන සියවස ඉතාලි අර්ධද්වීපයේ මධ්‍ය කොටසට වන්නට ටයිබර් ගඟ අසබඩ ආරක්ෂිත ස්ථානයක කුඩා ලතින් රාජ්‍යයක් ලෙස හෝ පෞර රාජ්‍යය ස්ථාපනය විය.
- බල ව්‍යාප්තියේ මුල්ම අවස්ථාව රෝමය ලතින් රාජ්‍ය වල ප්‍රධානත්වය ගනිමින් එකී රාජ්‍ය වල ආරක්ෂකයා වශයෙන් පෙනී සිටීම හා උතුරු ඉතාලි ප්‍රදේශ වල බලය ව්‍යාප්ත කිරීම
- බල ව්‍යාප්තියේ දුෂ්කර හා වැදගත් අවස්ථාව ක්‍රි.පූ. 264-202 අතර කාතේජය සමඟ කරන ලද පියුනික් යුද්ධ වීම
- මීළඟ අවස්ථාව ක්‍රි.පූ.197 සිට 146 දක්වා ග්‍රීක පෞර රාජ්‍ය වල ව්‍යාප්ත වීම
- ක්‍රි.පූ.146 න් පසු සිසිලියා, සාර්ඩිනියා, කෝෂිකා, ස්පාඤ්ඤය, මැසිඩෝනියාව හා අප්‍රිකාව වශයෙන් විශාල ප්‍රදේශයකට දකුණු හා බටහිරට ව්‍යාප්ත වීම
- එසේම උතුරින් ගෝල්වරු පරාජය දක්වාත් එතැන් සිට බ්‍රිතාන්‍ය දූපත් දක්වාත් බලය ව්‍යාප්ත කොට තිබීම

03) I) ඉතාලිය

II) පවුල් - මිලානයේ ස්ෆෝර්සා, ෆ්ලෝරන්ස්, මෙඩිචි, ෆුරාහිඑස්ටේ, මාන්ටුවාගේ ගොන්සාගා

පුද්ගලයන් - iv නිකලස්, vi ඇලෙක්සැන්ඩර්, ii ජුලියස්, x ලියෝ යන පාප්වරු

III) i) ඉතාලියේ ආර්ථික සමාජ හා දේශපාලන පසුබිම

ii) පැරණි රෝම ශිෂ්ටාචාරයේ ස්මාරක ශේෂව පැවතීම

iii) ඉතාලි විශ්වවිද්‍යාල වල විෂය මලාවේ දේව ධර්මය හැරුණු විට වෛද්‍ය විද්‍යාව හා නීතිය වැනි ලෞකික විෂයන් වලට වැඩි අවධානයක් දැක්වීම

iv) 1453 කොන්ස්තන්තිනෝපලය තුර්කීන් අතට පත් වීම

IV) i) ග්‍රීක හා ලතින් භාෂා වල ප්‍රබෝධයක් ඇති විම

ii) මානව වාදය නැගීම

iii) කලාව සම්බන්ධයෙන් ප්‍රබෝධයක් ඇති වීම

iv) චිත්‍ර කලාවේ ප්‍රබෝධයක් ඇති වීම

v) නව දේශපාලන චින්තනයක් ඉදිරියට පැමිණීම

04)

* 1618 සිට 1648 දක්වා ජර්මනිය කේන්ද්‍රකර ගනිමින් ආරම්භ වීම
* තිස් අවුරුදු යුද්ධය ආගමික සාධක ගණනාවක් හේතු කොට ගෙන ආරම්භ වූ නිසා එය ආගමික යුද්ධයක් ලෙස හඳුන්වයි

I) සමස්ථ යුරෝපයම කතෝලික හා ප්‍රොතෙස්තන්ත්‍ර යනුවෙන් ආගමික කොටස් දෙකක් ඇති වීම

II) ප්‍රොතෙස්තන්ත්‍රවාදය ආරම්භ වූ ජර්මනිය තුල මෙම බෙදීම ප්‍රබල ලෙස දක්නට ලැබේ

III) ඔග්ස්බර්ග් සමථයෙන් ආගමික ගැටුමට ස්ථිරසාර විසඳුමක් දීමට අපහසු වීම

IV) ජර්මනිය තුළ ආගමික පෙරමුණු දෙකක් හට ගැනීම හා ඒ තුළින් තිස් අවුරුදු යුද්ධය ආරම්භ වීම

V) විදේශ රටවල් මෙම පිල් දෙකෙන් එකකට ආධාර දීමට වරින් වර ඉදිරිපත් වීම

* තිස් අවුරුදු යුද්ධය ඇති වීමට දේශපාලන සාධක ගණනාවක් ද හේතු විම

I) ජර්මන් ප්‍රදේශ වල ශුද්ධ රෝම අධිරාජ්‍යා හා කුමාරවරුන් අතර තිබූ ගැටුම්

II) යුරෝපයේ රාජ්‍යයන් අතර පැවති තරගකාරී ස්භාවය

III) ඩෙන්මාර්කය, ස්වීඩනය හා ප්‍රංශය යුද්ධයට මැදිහත් වීම විශේෂයෙන්ම ප්‍රංශය මැදිහත් වීම තුළ දේශපාලන කරුණු වඩාත් හොදින් ඉස්මතු වීම

05) I) ග්‍රීක පෞර රාජ්‍යය

i) ඇතැන්ස්, ස්පාටා, කොරින්ත්, මෙගාරා, ආර්ගෝස්, මිලේටස්, සමෝස් යනුවෙන් ප්‍රකට පෞර රාජ්‍ය ගණනාවක් පැවතීම

ii) ස්වාධින රාජ්‍ය ලෙස පැවතීම

iii) භූමි ප්‍රමාණයෙන් හා ජන ග්‍රහයයෙන් කුඩා වීම

iv) පුරවැසියන් විදේශිකයන් හා වහලුන් ලෙස සමාජ ව්‍යුහය සකස් වීම

v) විවිධ ආණුඩු ක්‍රම පැවතීම   උදා ඨ- රාජාණ්ඩු, ප්‍රභූතන්ත්‍ර, කතිපයාධිපති, ප්‍රජා පීඩක, ප්‍රජාතන්ත්‍රවාදි

vi) ආගම

II) එංගලන්තයේ කාර්මික විප්ලවය ඇති වූ පසුබිම

i) එංගලන්තයේ විදේශ වෙළදාම පුළුල් වීම

ii) භාණ්ඩ ඉල්ලුම වැඩි වීම හා නිෂ්පාදනය පුළුල් කර ගැනීමේ අවශ්‍යතාව

iii) එංගලන්තය තුළ විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම වර්ධනය වීම

iv) වෙළඳාම දියුණු වීමත් සමඟ මූල ධනය උපයා ගත් ධනවතුන් බිහි වීම

v) කෘෂිකාර්මික විප්ලවය

vi) දේශපාලන ස්ථාවරත්වය

vii) අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තිය

III) ප්‍රතිරෙපරමාදුව

i) ප්‍රොතෙස්තන්ත්‍රවාදයට එරෙහිව කතෝලික සභාවෙන් එල්ල වූ ප්‍රතික්‍රියාව ප්‍රතිරෙපරමාදු ව්‍යාපාරය නම් වේ

ii) ප්‍රොතෙස්තන්ත්‍රවාදීන්ගේ ආගමික මතවාද බිඳ දැමීම හා ප්‍රොතෙස්තන්ත්‍රවාදය ව්‍යාප්ත වීම වැළැක්වීම හා කතෝලික සභාවේ බලය යලි පිහිටු වීම ප්‍රධාන අරමුණ විය

iii) ජේසුයිට් නිකාය, ට්‍රෙන්ට් සම්මේලනය හා අධර්ම මර්ධනාධිකරණය මෙහි ප්‍රධාන ක්‍රියාමාර්ග වේ

IV) ඇමරිකන් නිදහස් සටන ඇති වීමට තුඩුදුන් පසුබිම

i) එංගලන්තය උතුරු ඇමරිකාවේ ඉංග්‍රීසි ජනපද සම්බන්ධයෙන් යටත් විජිත ප්‍රතිපත්තියක් අනුගමනය කිරිම

ii) බ්‍රිතාන්‍යයේ ආර්ථික ප්‍රතිපත්තිය වාණිජවාදී න්‍යායට අනුව සකස් වී තිබීම

උදා:- 1.නම් කළ භාණ්ඩ මව් රටටම අලෙවි කළ යුතු වීම

2.එංගලන්තය නිපදවන භාණ්ඩ ජනපද වල නිපදවීම තහනම් වීම

3.ජනපද වලට ගෙන්වන අත්‍යවශ්‍ය භාණ්ඩ එංගලන්තය හරහා ගෙන්වා ගැනීම

iii) බ්‍රිතාන්‍ය යටත් විජිත ප්‍රතිපත්තියට එරෙහිව ජනපද වාසීන් විරෝධතා ඇති කිරීම හා ඒවා ක්‍රමයෙන් උත්සන්න වීම. ඒ සඳහා සාධක රැසක් බලපෑවේය.

iv) බොස්ටන් තේ සාදය

v) 1775 දෙපාර්ශවය අතර ගැටුම්

## C කොටස

06) (I)

i) ප්‍රංශයේ දේශසීමා, 1789ට පෙර පැවති තත්වයට ගෙන ඒම බූර්බෝන් රාජවංශය යලි බලයේ පිහිටුවීම

ii) පෙර පැවති 360කට අධික රාජ්‍ය කොටස් සංඛ්‍යාව වෙනුවට ජර්මනිය තුළ රාජ්‍ය කොටස් 39ක් ඇති කිරීම. ජර්මන් සංයුක්තය පිහිටුවීම හා එහි නායකත්වය ඔස්ට්‍රියාවට ලබා දීම

iii) ජර්මානු ප්‍රදේශය තුළ ඔස්ට්‍රියාව හා ප්‍රශියාව අතර බලය සමතුලිතතාවක් ඇති කිරීම. ඔස්ට්‍රියාව ලොම්බාර්ඩි හා වෙනිෂියා ලබා දීම හා ප්‍රශියාවට අමතරව ප්‍රදේශ ලබා දීම

iv) ඉතාලිය - නීත්‍යානුකූලවාදය තදින්ම ක්‍රියාත්මක වූයේ ඉතාලියේය. ලොම්බාර්ඩි, වෙනිෂියාව, පීඩ්මෝන්ට් - සාර්ඩිනියා, පර්මා, මොඩිනා, ටස්කනි පාප් රාජ්‍ය, නේපල්ස් හා සිසිලි යනුවෙන් ඉතාලිය කොටස් කර ඒවායේ පැරණි රාජවංශ යලි පිහිටුවීම

(II)

i) නැපෝලියන් විසින් වෙනස්කොට තිබූ යුරෝපා දේශපාලන සිතියම නැවත සකස් කිරීම

ii) 1815 සිට ඉදිරියට දිගු කලක් යුරෝපය තුළ සාමය ආරක්ෂා කර ගැනීමට සමත් වීම

iii) සමුළුවක් මගින් යුරෝපා රටවල් අතර හටගන්නා අර්බුධ විසඳා ගැනීමේ ක්‍රමයකට මුල පිරීම

iv) සමුළු ක්‍රමය

07) * 1917 ඔක්තෝබර් විප්පවයෙන් රුසියාවේ බලය අල්ලා ගැනීමෙන් පසු බෝල්ෂෙවික් පාලකයෝ ගැටලු හා අභියෝග ගණනාවකටම මුහුණ දුන්හ.

- මෙතෙක් ලොව කිසිඳු තැනක ක්‍රියාත්මක කර නොතිබූ සමාජවාදී වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම
- ස්වකීය බලය තහවුරු වන අන්දමේ ආණ්ඩු ක්‍රමයක් පිහිටුවා ගැනීම
- විප්ලව වාදීන්ගෙන් එල්ලවූ විරෝධය හා සිවිල් යුද්ධය
- ජර්මනිය සමඟ සමාදානයක් ඇතිකර ගැනීම
- බිඳවැටී තිබූ ආර්ථිකය යලි ගොඩනැගීම
- බෝල්ෂෙවික්වරු අනුගමනය කළ ක්‍රියාමාර්ග
- බෝල්ෂෙවික් වරුන්ට රුසියාව තුළ බහුතර බලයක් නොතිබිණි මේ නිසා ව්‍යවස්ථා සම්පාදක සභාව විසුරුවා හැර කොමියුනිස්ට් පක්ෂයේ මෙහෙයවීමෙන් යුත් ආණ්ඩුවක් පිහිටුවා ගැනීම
- ජර්මනිය සමඟ බ්‍රෙෂ්ට් - ලිබොවිස්ක් ගිවිසුම අත්සන් කොට යුද්ධයෙන් ඉවත් විම
- විදේශිය සහය ද ලත් ප්‍රතිවිප්ලවය පරාජය කිරීම
- නව ආර්ථික ප්‍රතිපත්තිය

08)

i) ෆැසිස්ට්වාදය - ඉතාලිය
නට්සිවාදය - ජර්මනිය

ii) බෙනිටෝ මුසෝලනි
ඇඩොල්ෆ් හිට්ලර්

iii)

- පළමුවැනි ලෝක යුද්ධයෙන් උද්ගත වූ තත්වය

ඉතාලිය:- පළමු ලෝක යුද්ධයේදී ජයග්‍රාහක පිලේ සිටි නමුත් ඉතාලිය යුද්ධාවසානයේ දී බ්‍රිතාන්‍ය හා ප්‍රංශය තරම් වාසිදායක ප්‍රතිඵල අත්පත් කර ගැනීමට සමත් නොවීම. මේ නිසා ඉතාලි ජාතිකයන් තුළ ඇති වී තිබූ කලකිරීම හා ඉතාලිය තුළ ශක්තිමත් ආණ්ඩුවක් ඇති කරගත යුතුය යන අදහස මතුව ඒම

ජර්මනිය:- වර්සායි ගිවිසුමෙන් ජර්මනියට දැඩි දඬුවම් පමුණුවීම හා ජර්මනිය අවමානයට පත් වීම

- දේශපාලනික

  ඉතාලිය:- දේශපාලන අස්ථාවරත්වය

  ජර්මනිය:- වෛමාර් සමූහාණ්ඩුවේ දුර්වල පාලනය

- ආර්ථික

  ඉතාලිය:- I වන ලෝක යුද්ධයෙන් පසු විවිධ ආර්ථික අර්බුධ මතුවීම

  ජර්මනිය:- දැඩි ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දීම

- සමාජවාදී ව්‍යාපාරවල දුර්වලතා
- මුසෝලනීගේ හා හිට්ලර්ගේ පෞරුෂ හා නායකත්වය

iv)

- ඉතාලියේ හා ජර්මනියේ බිහිවූ ෆැසිස්ට්වාදී හා නට්සිවාදී ආණ්ඩු අවට ප්‍රදේශ ආක්‍රමණය කොට ඒවා යටත් කර ගැනීම
- ප්‍රජාතන්ත්‍රවාදයට හා සමාජවාදයට එම ආණ්ඩු විරුද්ධ වීම
- යුරෝප වෙනත් බලවතුන් ෆැසිස්ට්වාදයට හා නට්සිවාදයට විරුද්ධව එක් පෙරමුණකට එකතු වීම
- මීට අමතරව
  - ❖ දෙවන ලෝක යුද්ධයේ මූල බීජ වර්සෙල්ස් ගිවිසුමේ ගැබ්ව තිබීම
  - ❖ ලෝක බලවතුන්ගේ උදාසීනත්වය
  - ❖ ජාතීන්ගේ සංගමය මුළුමනින්ම අඩපන වීම
  - ❖ අවි ආයුධ තරඟය
  - ❖ ජපන් යුධ වාදයේ නැගීම

09)

01) එක්සත් ජාතීන්ගේ සංවිධානය

i) 1945 අප්‍රේල් සිට ජුනි තෙක් තෙක් පවත්වන ලද ෆ්‍රැන්ස්කෝ සමුළුව මගින් එක්සත් ජාතින්ගේ ප්‍රඥාප්තිය සකස් කිරීම.

ii) 1945 ඔක්තෝම්බර් 24 එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටු වීම.

iii) ප්‍රධාන ආයතන හා එහි කාර්ය භාර්යය

iv) එක්සත් ජාතීන්ගේ සංගමයේ අරමුණු

v) ලෝක සාමය සඳහා ගත හැකි ක්‍රියා මාර්ග හා ගත් ක්‍රියා මාර්ග

02) නිරවි යුද්ධය

i) දෙවන ලෝක යුද්ධයෙන් පසු ඇමරිකා එක්සත් ජනපදය ප්‍රධාන කොටගත් ධනවාදී කඳවුර හා සෝවියට් දේශය ප්‍රධාන කොටගත් නැගෙනහිර යුරෝපා රටවලින් යුත් සමාජවාදී කඳවුර අතර ඇති වූ දෘෂ්ටිමය රාජතාන්ත්‍රික ගැටුමයි.

ii) ක්‍රි.ව. 1945 සිට 1991 දක්වා පැවතුණි

iii) නිරවි යුද්ධයේ ලක්ෂණ

iv) වරින් වර ඇති වූ ගැටුම් හැර වෙනත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක වීම

03) 1848 විප්ලවය

i) 1848 යුරෝපයේ විප්ලව වර්ෂය වශයෙන් හැඳින්වීම.

ii) වියානා සම්මේලනයේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක වීමේදී ඊට එරෙහිව යුරෝපය තුල ජාතිකත්ව හැඟීම් වර්ධනය වීම.

iii) ප්‍රංශය, ඔස්ට්‍රියාව වැනි රටවල ලිබරල් හා ජාතිකවාදී ව්‍යාපාර වලට එරෙහිව එම රටවල පාලකයන් මර්ධනය කිරීම

iv) යුරෝපයේ පැතිර යමින් ලිබරල් දේශපාලක චින්තන බලපෑම

v) ප්‍රංශය, ජර්මනිය, ඔස්ට්‍රියාව, හංගේරියාව, ඉතාලිය යන රටවල ඇතැම් ප්‍රධාන නගර වල විප්ලවය හට ගැනීම

vi) නගර වලින් පසු ගම් බද ප්‍රදේශ වලට ව්‍යාප්ත වීම

vii) උගතුන් හා බුද්ධිමතුන්ගේ දායකත්වය ලැබීම

4) ජෝසප් ස්ටාලින්

i) 1879 දි ජෝර්ජියාවේ උපත ලැබ 1904 දී බෝල්ෂෙවික් පක්ෂයට බැඳුණු ඔහු 1917 දී බෝල්ෂෙවික් විප්ලවයේ නායකයෙකු වීම

ii) 1924 දි කොමියුනිස්ට් පක්ෂයේ මහ ලේකම් පදවිය ලැබීම

iii) ට්‍රොට්ස්කි සමග තරගයක් ඇතිකර ගැනීම

iv) සෝවියට් දේශය තුළ පස් අවුරුදු සැලසුම් ක්‍රියාත්මක කිරීම

v) කෘෂිර්මාන්තය දියුණු කිරීම සඳහා සමූහ ගොවිපලවල් ඇරඹීම

vi) සෝවියට් දේශය තුළ දැඩි ඒකාධිපති පාලනයක් ගෙනයාම

vii) 1953 මියයාම